## අඟහරුවාදා

පළමුවන කියැවීම රෝම 12: 5–16

ශුද්ධ වූ පාවුළු තුමන් විසින් රෝමවරුන් වෙත යවන ලද හසුනෙන් කොටසකි.

"අපි ක්‍රිස්තුස් වහන්සේ හා සම්බන්ධ ව, එකම ශරීරයක් වී, එහි අවයවයෝ වෙමු.

එසේම බොහෝ දෙනෙක් වූ අපිත් ක්‍රිස්තුස් වහන්සේ හා සම්බන්ධ ව එක ශරීරයක් වී, එහි වෙන් වෙන් වශයෙන් අන්‍යොන්‍ය අවයවයෝ වම්හ. අපට දෙන ලද දේව වරප්‍රසාදය අනුව අපේ කුසලතා විවිධ ය. ඒ කුසලතාව දහම් දෙසීම පිණිස නම්, අපේ ඇදහිල්ලේ ප්‍රමාණය අනුව දහම් දෙසමු. එය ශුභ සාධක සේවය නම්, ඒ සේවයෙහි නිරත වෙමු. ගුරුවරයා ගුරු සේවයෙහි යෙදේවා. අනුශාසකයා අනුශාසනා දීමට කැප වේවා. ආධාර දෙන්නා ත්‍යාගශීලි ව දේවා. මූලිකත්වය දරන්නා උද්යෝගිමත් ව සිටීවා. ලෙඩ දුකට පිහිට වන්නා ප්‍රීතියෙන් එසේ කෙරේවා.

ප්‍රේමය අවංක වේවා! නපුර පිළිකුල් කොට, යහපතට ඇලුම් වන්න. සුහද සහෝදර ප්‍රේමයෙන් එකිනෙකාට ප්‍රේම කරන්න. ගෞරවයෙන් තමාට වඩා අනෙක් අය උතුම් කොට සලකන්න. අලසකමින් තොරව, කාර්යශීලී වන්න. උද්යෝගිමත් හදකින් ස්වාමින් වහන්සේට සේවය කරන්න. බලාපොරොත්තුවෙහි ප්‍රීති වන්න. විපතේ දී ඉවසිලිමත් වන්න. යාච්ඤාවෙහි නොකඩවා යෙදෙන්න. සැදැහැවතුන්ගේ ඕනෑ එපාකම් වලදී උපකාර කරන්න. ආගන්තුක සත්කාරයට ලැදිව සිටින්න.

ඔබට පීඩා කරන්නන්ට ආශිර්වාද කරන්න. ශාප නොකර ආශිර්වාද ම කරන්න. ප්‍රීති වන්නන් සමග ප්‍රීති වන්න. ශෝක වන්නන් සමග ශෝක වන්න. හැම දෙනා සමග එක්සිත්ව ඉන්න. අහංකාර නොවී යටහත් පහත් අය ආශ්‍රය කරන්න. ඔබ ප්‍රඥාවන්ත යයි සිතා උඩඟු නොවන්න.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 131: 1–3

පිළිතුර : සමිඳුනි, අප සිත් සන්සුන් කළ මැනව.

ගීය : සමිඳුනි, මාගේ සිත තුළ අහංකාරයක් නැත.
උදාරම් ලෙස මම ඇස් නොඔසවමි.
වඩා උසස් දේ ගැන වත්
මාගේ තරම ඉක්මවා යන දේ ගැන වත් මම කරදර නොවෙමි.

ඒ වෙනුවට මම ලද දෙයින් තිහතමානී ව සැනසී සිටිමි.
මවු තුරුල්ලේ සංයුක්ත ව සිටින ළදරුවකු සේ
මා තුළ මාගේ සිත සන්සුන් වී ඇත.

එම්බා ඉශ්‍රායෙල්වරුනි, මෙතැන් පටන් සදහට ම
සමිඳුන් කෙරෙහි බලාපොරොත්තු වන්න.

සුපුවත් ජය නද එපේසි 1: 17–18

ආලේලූයා! ආලේලූයා!
අපගේ සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පියාණන් වූ
දෙවියන් වහන්සේ අවබෝධ කර ගැනීම පිණිස අපේ ඥානය නමැති නෙත්,
ආලෝක කරන සේක්වා!
ආලේලූයා!

නොහොත්

සුපුවත් ජය නද මතෙව් 11: 28

ආලේලූයා! ආලේලූයා!
“වෙහෙස වන බර උසුලන සියල්ලෙනි, මා වෙත එන්න.
මම ඔබට සහනය දෙමි” යි
සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 14: 15–24

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

නුවර වීදි වලට ගොස් දිළිඳුන් ද, අබ්බගාතයන් ද, අන්ධයන් ද, කැඳවා මාගේ ගෘහය පුරවන්න.

ස්වාමින් වහන්සේ සමඟ භෝජනයට සහභාගි වූ අයගෙන් කෙනෙක් “දෙවියන් වහන්සේගේ රාජ්‍යයෙහි දී ආහාර වළඳන තැනැත්තේ භාග්‍යවන්තයෙකැ” යි ජේසුස් වහන්සේට කීය. එහෙත් උන් වහන්සේ කතා කරමින් මෙසේ වදාළ සේක: “එක් මිනිසෙක් මහා මංගල භෝජනයක් පිළියෙල කොට බොහෝ දෙනෙකු කැඳවීය. භෝජන වේලාව පැමිණෙත් ම, ‘එන්න, දැන් සියල්ල සූදානම් ව ඇතැ’ යි කැඳවනු ලැබූවන්ට කියනු පිණිස ඔහු සිය දාසයා යැවී ය. එහෙත් ඔවුහු සියල්ලෝ ම නැවිත් සිටීමට එකහෙළා කරුණු කියන්නට පටන් ගත්හ. පළමුවැන්නා, ‘මම කෙතක් මිල දී ගතිමි. එය බලන්නට යාම අත්‍යාවශ්‍ය ම ය. මට, කමා වන මෙන් ඉල්ලමි’ යි ඔහුට කීය. තව කෙනෙක්, මම ගොන් පස් බානක් මිල දී ගතිමි. ඔවුන් වැඩට හොඳ ද කියා අත්හදා බලන්නට යමි. මට කමා වන මෙන් ඉල්ලමි’ යි ඔහුට කීය. තවත් කෙනෙක්, ‘මම ස්ත්‍රියක විවාහ කර ගතිමි. එබැවින් එන්නට නොහැකි ය’ යි කීය. ඒ දාසයා පෙරළා පැමිණ සිය ස්වාමියාට එපවත් දැන්වී ය. එවිට ගෘහපතියා කෝපව, ‘වහාම නුව වීදිවලට ද පටු මාවත් වලට ද යව. දිළිඳුන් ද අබ්බගාතයන් ද අන්ධයන් ද කොරුන් ද මෙහි ගෙනෙව’ යි සිය දාසයාට කීය. දාසයා ද, ‘ස්වාමිනි, ඔබ අණ කළ ලෙස කළෙමි. එහෙත් තවත් ඉඩකඩ ඇතැ’ යි කීය. එවිට ස්වාමියා දාසයාට කතා කොට, ‘මහ මාවත් වලට ද දෙවටවලට ද යව, මාගේ ගෙය පිරී යන තරම් සෙනඟට එන්නට බල කරව’ යි කීය. මම ඔබට කියමි. ආරාධිතයන් අතුරෙන් එකෙකුවත් මාගේ මංගල භෝජනයේ රස නොබලන්නේ ය.”

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.